මලියදේව විද්‍යාලය, කුරුණෑගල
Maliyadeva College, Kurunegala

අනාවරණ පරීක්ෂණය - 12 ශ්‍රේණිය- 2022 සැප්තැම්බර්
Diagnostic Test- Grade 12 -2022 September

විභාග අංකය-

භෞතික විද්‍යාව -I

කාලය- පැය 02

නම - ....

පන්තිය-

01) ආවේගයේ ඒකක සමාන වන්නේ මින් කුමන ඒකකයකටද?

1) බල ඝූර්ණයට
2) රේඛීය ගම්‍යතාවයට
3) රේඛීය ගම්‍යතාවය වෙනස්වීමේ ශීඝ්‍රතාවය
4) බලය
5) පීඩනය

02) $S = a+bt+ct^2$, S මීටර් මගින්ද, t තත්පර මගින්ද මැන ඇත. c හි ඒකක වනනේ,

1) m^{-1}
2) m
3) ms^{-1}
4) ms^{-2}
5) s^{-1}

.22 A/L අපි [papers grp

03) ගලක් සිරස්ව ඉහලට විසිකළ විට ප්‍රවේග - කාල ප්‍රස්ථාරය රූපයේ දැක්වේ. ආරම්භක ප්‍රවේගය $30ms^{-1}$, ඉහලට දිශාව + නම් ගල ඉහළ නගින උපරිම උස සොයන්න.



1) 30 m
2) 45m
3) 60m
4) 90m
5) 75m

4) කිලෝවොට් - පැය හි මාන වන්නේ,

1) ML^2T^{-2} 2) MLT^{-1} 3) ML^2T^{-3} 4) T 5) T^{-1}

5) SI මූලික ඒකකයක් සහ SI පරිපූරක ඒකකයක් සඳහන් වන්නේ මින් කුමකද?

1) A, *mol* 2) K, rad 3) J, strad 4) m, W 5) g, rad

CamScanner
Scanned with CamScanner

6) ජලයේ තරංග ප්‍රවේගය (V) පහත රාශි මත රඳා පවතී.

1) තරංග ආයාමය (λ)

2) ජලයේ ඝනත්වය (d)

3) ගුරුත්වජ ත්වරණය (g)

මෙම රාශි අතර නිවැරදි සම්බන්ධතාවය වන්නේ,

1) $V^2 = \lambda g d$ 2) $V^2 = \frac{1}{\lambda g d}$ 3) $V^2 = \lambda g$ 4) $V^2 = \lambda d$ 5) $V^2 = gd$

7) රූපයේ දැක්වෙන වර්නියර කැලිපරයේ ප්‍රධාන පරිමාණ බෙදුම් 9 ක් වර්නියර් පරිමාණ බෙදුම් 10කට බෙදා ඇත. මෙහි දැක්වෙන පාඨාංකය වන්නේ,



1) 3.14cm 2) 3.22 cm 3) 3.12 cm 4) 31.4 cm

5) 32.2 cm

08) මෙහි දැක්වෙන පාඨාංකය වන්නේ,

1) 5.31 mm 2) 6.31 mm

3) 5.79 mm 4) 5.531 mm

5) 5.81 mm



9) තහඩුවක ඝනකම මැනීමේ දී ලබා ගත් පාඨාංක වල රූප සටහන් පහත දැක්වේ. තහඩුවේ ඝනකම වන්නේ,



.22 A/L අපි [papers grp]

1) 2.7 mm 2) 0.1 mm 3) 1.3 mm 3) 2.4 mm 4) 1.7 mm

CS CamScanner
Scanned with CamScanner

10) වස්තුවක් t = 0 දී නිශ්චලතාවයෙන් ගමන් අරඹා දී ඇති රූප සටහනේ පරිදි ත්වරණයකට ලක්වේ.



.22 A/L අපි [papers grp]

මෙහි t = 0s සිට t = 4s දක්වා කාලය තුල විස්ථාපන - කාල ප්‍රස්ථාරය (s – t) ප්‍රස්ථාරය) පෙන්වනු ලබන්නේ,



(1)



(2)



(3)



(4)

5) ඉහත කිසිවක් නොවේ.

CamScanner
Scanned with CamScanner

11) ඒකාකාර ත්වරණයෙන් ගමන් කරන 150m ක් දිග දුම්රියක් දිග දුම්රියක් 300m ක් දිග වේදිකාවක් පසු කරයි. එය වේදිකාව වෙත ඇතු ල් වන වේගය $40ms^{-1}$ කි. පිටවන වේගය $50ms^{-1}$. දුම්රියේ ත්වරණය සොයන්න.

1) $0.6ms^{-2}$ 2) $0.8 ms^{-2}$ 3) $1.0 ms^{-2}$ 4) $1.2ms^{-2}$ 5) $0.7ms^{-2}$

12) වස්තුවක් h උසැති කුළුනක මුදුනේ සිට අතහැරිය විට එය චලිතයේ අවසාන තත්පරයේදී $h/3$ උසක් ගමන් කරයි. $g = 10ms^{-2}$ නම්, පොළොවට ලඟා වීමට එයට ගතවන කාලය වන්නේ,

1) $(2+\sqrt{3})s$ 2) $(3+\sqrt{6})s$ 3) $(1+\sqrt{3})s$ 4) $(2+\sqrt{6})s$ 5) $(4+\sqrt{6})s$

13) සමාන දෛශික දෙකක සම්ප්‍රයුක්ත දෛශිකයේ විශාලත්වය ඒම දෛශික වල විශාලත්වයට සමාන වේ. එම දෛශික 2ක අතර කෝණය වන්නේ,

1) 60^0 2) 90^0 3) 120^0 4) 150^0 5) 165^0

14) පිහිනුම් කරුවෙකු නිශ්චල ජලයේ $5ms^{-1}$ වේගයෙන් පිහිනිය හැක. ගඟක් හරහා පිහිනන විට ඔහුගේ සාමාන්‍ය වේගය $3ms^{-1}$ ක් වුයේ නම් හා ඔහු හැකි කෙටිම කාලයකින් ගඟ තරණය කළේ නම්ද. ගඟේ වේගය වන්නේ,

1) $2ms^{-1}$ 2) $4ms^{-1}$ 3) $6ms^{-1}$ 4) $8ms^{-1}$ 5) $3ms^{-1}$

15) සමතල භූමියක ඇති කාල තුවක්කින් තිරසට α කෝණයක් ආනතව V_0 ප්‍රවේගයෙන් R දුරකින් පිහිටි සිරස් කුළුණක් වෙතට උණ්ඩයක් යවනු ලැබේ. උණ්ඩය කුළුණේ සිරස් බිත්තියේ වදින්නේ එහි පාමුල සිට කොපමණ සිරස් උසකින්ද?

1) $R\sin\alpha - \frac{1}{2}\frac{gR^2}{v_0^2\sin^2\alpha}$

2) $R\cos\alpha - \frac{1}{2}\frac{gR^2}{v_0^2\cos^2\alpha}$

3) $R\tan\alpha - \frac{1}{2}\frac{gR^2}{v_0^2\cos^2\alpha}$

4) $R\tan\alpha - \frac{1}{2}\frac{gR^2}{v_0^2\sin^2\alpha}$

5) $R\cos\alpha - \frac{1}{2}\frac{gR^2}{v_0^2\tan^2\alpha}$

16) රූපයේ දැක්වෙන පරිදි ස්කන්ධය m_2 වන කුට්ටිය තිරස් සුමට තලයක පවතී. එය තන්තුවකින් ගැට ගසා තන්තුව සුමට කප්පිය මතින් යවා අනෙක් කෙළවර ස්කන්ධය m_1 වන කුට්ටියක් එල්ලා ඇත.
$m_1 > m_2$ වේ. g යනු ගුරුත්වජ ත්‍රැත්වජ ත්වරණයයි.
එවිට ස්කන්ධවල පොදු ත්වරණය වන්නේ,



1) $\frac{m_1}{m_2}g$ 2) $\frac{m_2}{m_1}g$ 3) $\frac{m_1 g}{m_1+m_2}$

4) $\frac{m_2 g}{m_1+m_2}$ 5) ඉහත කිසිවක් නොවේ.

.22 A/L අපි [papers grp]

CS CamScanner
Scanned with CamScanner

17) තිරසට θ කෝණයකින් ආනත තලයක ඉහල භාගය සුමට වන අතර පහළ භාගය රළු වේ. වස්තුවක් ආනත තලයේ මුදුනේ සිට නිශ්චලතාවයෙන් අතහැරිය විට එය ආනත තලය දිගේ ගොස් නැවත තලය පාමුලදී නිශ්චල වන්නේ වස්තුවත් තලයේ පහළ භාගයත් අතර ඝර්ෂණ සංගුණකය මින් කුමක් වන විටද?

1) $\mu = 2tan\theta$
2) $\mu = tan\theta$
3) $\mu = \frac{2}{\tan\theta}$
4) $\mu = \frac{1}{\tan\theta}$
5) ඉහත කිසිවක් නොවේ.

18) ස්කන්ධය 6kg හා දිග 3m වන ඒකාකාර ඝන තන්තුවක් සිරස්ව එල්ලා ඇත. එල්ලා ඇති ස්ථානයේ සිට 1m පහලින් වූ තන්තුවේ ලක්ෂ්‍යයක ආතතිය සොයන්න.($g = 10ms^{-2}$)

1) 20N
2) 30N
3) 40N
4) 60N
5) 50N

19) ස්කන්ධය M වූ බැලුනයක් a ත්වරණයකින් ඉහළ නගී. m ස්කන්ධය බැලුනයෙන් ඉවත් කළ විට එහි ත්වරණය වන්නේ,

1) $\frac{Ma+mg}{M-m}$
2) $\frac{Ma+mg}{M+m}$
3) $\frac{ma+Mg}{M-m}$
4) $\frac{ma+Mg}{M+m}$
5) $\frac{Ma-mg}{M+m}$

20) උත්තෝලකයක් ඉහල නැගීමේදී එහි වේගය - කාලය සමඟ වෙනස්වන ආකාරය රූපයේ දැක්වේ. උත්තෝලකයේ හා මගීන්ගේ මුළු ස්කන්ධය 1000kg ද $g = 10ms^{-2}$ ද වේ.



22 A/L අපි [papers grp]

පහත ප්‍රකාශ සලකා බලන්න.

A. $t = 1S$ දී උත්තෝලකයේ තන්තුවේ ආතතිය 12,000N වේ.
B. $t = 6S$ දී උත්තෝලකයේ තන්තුවේ ආතතිය 10,000N වේ.
C. $t = 11S$ දී උත්තෝලකයේ තන්තුවේ ආතතිය 8,000N වේ.
D. උත්තෝලකය මගින් ගෙනයන උස වන්නේ 40m කි.

මින් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය කුමක්ද?

1) A පමණි.
2) B පමණි.
3) A හා B පමණි.
4) C හා D පමණි.
5) A,B,C හා D සියල්ල නිවැරදිය.

CS CamScanner
Scanned with CamScanner

21) ස්කන්ධය m කුට්ටිය තිරසට θ කෝණයකින් ආනත වූ ආනත තලයක් දිගේ ඉහලට චලිත වේ. තලය හා කුට්ටිය අතර ඝර්ෂණ සංගුණකය μ නම්, තලය දිගේ x දුරක් චලිත වීමේදී සිදු කරන කාර්ය ප්‍රමාණය,

1) $mgx(\sin\theta + \mu\cos\theta)$

2) $mgx\sin\theta$

3) $mgx(\sin\theta - \mu\cos\theta)$

4) $\mu mgx\cos\theta$

5) $\mu gx\tan\theta$

22) තිරස් මේසයක් මත ස්කන්ධය 2kg ක් වූ වස්තුවක් නිශ්චල පවතී. 10N බලයක් 4s කාලයක් තුල වස්තුව මත යොදනු ලැබේ. $g = 10ms^{-2}$ වේ. වස්තුව සහ මේසය අතර ගතික ඝර්ෂණ සංගුණකය 0.2 කි. සම්ප්‍රයුක්ත බලය මගින් කරන ලද කාර්ය වන්නේ,

1) 144J

2) 96J

3) 72J

4) 36J

5) 56J

.22 A/L අපි [papers grp]

23) සරල අවලම්භයක දිග l වේ. අවම්භ බට්ටා එහි සමතුලිත පිහිටීම සිට α කෝණයක් ආනතව පසෙකට ඇද අත හරී. එය සමතුලිත පිහිටීම පසුකරන විට බට්ටාගේ වේගය වන්නේ,

1) $\sqrt{2gl}$ 2) $\sqrt{2gl\cos\alpha}$ 3) $\sqrt{2gl(1-\cos\alpha)}$

4) $\sqrt{2gl(1-\sin\alpha)}$ 5) ඉහත කිසියක් නොවේ.

24) සුමට අර්ධ ගෝලීය බඳුනක් තුල ඇති කුඩා ගෝලයක් එහි h උසක සිට තල්ලු කරනු ලැබේ. එම බෝලය බඳුනේ අනෙක් කෙලවරට ලඟාවීමට බෝලය කුමන වේගයකින් තල්ලු කල යුතුද? බඳුනේ උස R වේ.

1) $\sqrt{2gh}$ 2) $\sqrt{2gR}$ 3) $\sqrt{2g(R+h)}$ 4) $\sqrt{2g(R-h)}$

5) $\sqrt{2g(CR^2+h^2}$

25) m සහ 4m වූ ස්කන්ධ 2ක වේග . අතර අනුපාත 2 : 1 වේ. ඒවායේ රේඛීය ගම්‍යතාවල අනුපාතය වන්නේ,

1) $^1/_{\sqrt{2}}$ 2) $^1/_2$ 3) $^1/_4$ 4) $^1/_{16}$ 5) $^1/_{\sqrt{3}}$

26) වස්තුවක ගම්‍යතාවය 20% කින් වැඩිවන විට, එහි චාලක ශක්තිය වැඩිවන්නේ,

1) 44% 2) 55% 3) 66% 4) 77% 5) 88%

Scanned with CamScanner

27) ස්කන්ධය 0.1kg ක් වන අංශුවක් මතට බලයක් යොදයි. පහත රූපයේ ආකාරයටය. එය X = 0 දී නිශ්චල ගමන් අරඹයි නම්, X = 12m දී එහි ප්‍රවේගය වන්නේ,



1. ශූන්‍ය වේ.
2. $20\sqrt{2}ms^{-1}$
3. $20\sqrt{3}ms^{-1}$
4. $40ms^{-1}$
5. $45\ ms^{-1}$

28) පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ තෝරන්න.

A) අවස්ථිති - රාමුවක් ත්වරණය නොවේ.
B) අවස්ථිති රාමුවක් භ්‍රමණය නොවේ.
C) අවස්ථිති රාමුවකට සාපේක්ෂ නියත ප්‍රවේගයෙන් චලිත වන නිර්දේශ රාමුවද අවස්ථිති රාමුවකි.
D) නිව්ටන් නියම අවස්ථිති හා අවස්ථිති නොවන රාමු යන අවස්ථා දෙකටම යොදා ගැනේ.

1. A පමණක් සත්‍ය වේ.
2) B පමණක් සත්‍ය වේ.
3) C පමණක් සත්‍ය වේ.
4) A සහ Bපමණක් සත්‍ය වේ.
5) A,B සහ C පමණක් සත්‍ය වේ.

29) වස්තුවක් මත බලයක් යෙදීමේදී සිදු කරන කාර්යය ස්වායත්ත වන්නේ, (පහත ප්‍රකාශ සලකා බලන්න.)

A) වස්තුවක ස්කන්ධය
B) වස්තුවක විස්ථාපනය
C) වස්තුවක ආරම්භයක ප්‍රවේගය
D) බල දෛශිකය හා විස්ථාපන දෛශිකය අතර කෝණය

1) A පමණක් සත්‍ය වේ.
2) A සහ B පමණක් සත්‍ය වේ.
3) A සහ C පමණක් සත්‍ය වේ.
4) C සහ D පමණක් සත්‍ය වේ.
5) සියළු ප්‍රකාශ අසත්‍ය වේ.

30) ස්කන්ධය 1500Kg ක් වන කාරයක්, තිරස් පාරක $5ms^{-1}$ ක ඒකාකාර වේගයෙන් ගමන් කරයි. ඝර්ෂණ බලය 1500N ක් නම් කාරයේ එන්ජිම මඟින් යෙදෙන බලය කොපමණද?

1) 5.0kw
2. 7.5 kw
3. 10kw
4) 12.5 kw
5) 16kw

31) ජල විදුලි බලාගාරයක වේල්ලේ උස 10m කි. 1MW විද්‍යුත් ශක්තිය නිපදවීමට ටර්බයින තල මත තත්පරයකදී වැටිය යුතු ජල ස්කන්ධය කොපමණද? g = 10ms-2

1) $10^3 kgs^{-1}$
2) $10^4\ kgs^{-1}$
3) $10^5\ kgs^{-1}$
4) $10^6\ kgs^{-1}$
5) $10^8\ kgs^{-1}$

22 A/L අපි [papers grp]

CamScanner
Scanned with CamScanner

32) රූපයේ දැක්වෙන පරිදි ස්කන්ධය M වූ කරත්තයකට m වූ ස්කන්ධයක් සම්බන්ධ වී ඇත. ස්කන්ධය සහ කරත්තය අතර ඝර්ෂණ සංගුණකය μ නම් ස්කන්ධය බිම පතිත නොවීමට කරත්තයට තිබිය යුතු අවම ත්වරණය කුමක් ද?

1) μg 2) g/μ 3) μ/g 4) $\mu Mg/m$ 5) $\mu M/mg$

33) වස්තුවක් රළු තිරස් තලයක් මත චලිතයක් ඇති කරන විට එය මත යෙදිය යුතු F බලය ක්‍රමයෙන් වැඩි වේ. එම බලය ඝර්ෂණ බලය f සමඟ වෙනස් වන ආකාරය නිරූපණය වන්නේ,



.22 A/L අපි [papers grp]

34) සර්වසම පොත් තුනක් පහත රූපයේ පරිදි එක මත එක තබා ඇත. මෙම පොත් කට්ටලයේ ගුරුත්ව කේන්ද්‍රය පිහිටිය හැක්කේ,

1) A
2) B
3) C
4) D
5) E



35) විශාලත්වයෙන් හා දිශාවෙන් නියත වූ තිරස් බලයක් සුමට තිරස් පෘෂ්ඨයක් මත ඇති නිශ්චලතාවයේ ඇති අංශුවක් මත ක්‍රියාකරයි. අංශුව මත සිදු කරන කාර්යය W සහ අංශුවේ ප්‍රවේගය V අතර ප්‍රස්ථාරය නිරූපණය කරනු ලබන්නේ,

(වෙනත් තිරස් බල කිසිවක් අංශුව මත ක්‍රියා නොකරයි.)

(1)



2)



3)



4)



5)



.22 A/L අපි [papers grp]

36) තුවක්කුවකින් උණ්ඩයක් නිකුත් කරන විට තුවක්කුව නිදහසේ වාංගු වේ නම්, තුවක්කුවේ චාලක ශක්තිය

1) උණ්ඩයට වඩා අඩුය.

2) උණ්ඩයට වඩා වැඩිය

3) උණ්ඩයට සමාන වේ.

4) උණ්ඩයට සමාන හෝ අඩු අගයක් ගනී.

5) ඉහත කිසිවක් නොවේ.

37) 50 N බලයක් x සංරචකය 30N කි. එම බලයේම Y දෙසට සංරචක කොපමණ ද?

1) 20N 2) 30N 3) 40N 4) 50N 5) 60N

CS CamScanner
Scanned with CamScanner

38) මේවා අතරින් සෘණ විය හැක්කේ,

1) වේගය 2) ස්කන්ධය 3) ප්‍රවේගය 4) දුර 5) කාලය

39) රථයක් $36 kmh^{-1}$ ප්‍රවේගයෙන් ගමන් කරයි. බාධකයක් දැක රියදුරා තිරිංග යොදා $5 m/s^2$ මන්දනයකින් ගමන් කරයි. වාහනය නැවතීමට පෙර ගමන් කරන දුර වන්නේ,

1) 19m 2) 17m 3) 16m 4) 18m 5) 12m

40) ඒකාංග දෝෂ ඉවත් කල හැක්කේ,

1) නැවත නැවතත් ගන්නා මිනුම් මගින්
2) උපකරණය වෙනස් කිරීමෙන්
3) පාඨාංක වල මධ්‍ය අගය ගැනීමෙන්
4) පාඨාංක වල විචලනය සෙවීමෙන්
5) ඉහත කිසිවක් නොවේ.

41) දීප්ත තීව්‍රතාවයේ ඒකකය මින් කුමක් ද?

1) ලුමන් 2) කැන්ඩෙලා 3) ඩයොප්ටර්
4) සීමන්ස් 5) වේබර්

42) යම් මිනුමක ලබා ගත් අගය හා සත්‍ය අගය වෙනස වන්නේ,

1) නිරපේක්ෂ දෝෂයයි.
2) මුළු දෝෂයයි.
3) ගනික දෝෂයයි.
4) සාපේක්ෂ දෝෂයයි.
5) ඒකාංග දෝෂයයි.

43) වස්තු 2ක් අතහරිනු ලබන්නේ උස අනුපාත 3:5 වන පරිදි ඒවායේ අවසන් ප්‍රවේග අතර අනුපාත පිළිවෙලින්,

1) 9:25 2) $\sqrt{3} : \sqrt{5}$ 3) 5 : 3 4) $\sqrt{5} : \sqrt{3}$ 5) $\sqrt{6} : \sqrt{3}$

44) m_1 ස්කන්ධයක් ඇති අංශුවක් u_1 ප්‍රවේගයෙන් චලිත වී m_2 ස්කන්ධයක් ඇති නිශ්චලතාවයේ පවතින වෙනත් අංශුවක් සමඟ ගැටේ. ගැටුම පූර්ණ ප්‍රත්‍යාස්ථ නම්, චාලක ශක්තියේ භාගික හානිය වනුයේ,

1) $^1/_4\, m_1 u_1 2$
2) $\frac{m_2}{m_1}$
3) $\frac{m_2}{m_1 + m_2}$
4) $\frac{m_1}{m_1 + m_2}$
5) $\frac{m_1}{m_2}$

45) 1kg ක ස්කන්ධයක් ඇති බෝලයක් නිශ්චලතාවයේ ඇති ස්කන්ධය නොදන්නා තවත් දෙවන බෝලයක් සමඟ ගැටී එහි ආරම්භක වේගයෙන් තුනෙන් පංගුවක වේගයෙන් නැවත පොළා පනී. බෝලයේ ස්කන්ධය වන්නේ, (දෙවන බෝලයටද තුනෙන් පංගුවක වේගයෙන් ලැබේ.

1) 1kg 2) 4kg 3)3kg 4) 2kg 5) 5kg

.22 A/L අපි [papers grp]

CamScanner
Scanned with CamScanner

46) පිතිකරුවකු පන්දුවට පහර දීමට ප්‍රථම ක්‍රිකට් පන්දුව $20ms^{-1}$ ක වේගයෙන් ගමන් කරයි. බෝලයේ ස්කන්ධය 0.15Kg වේ. පන්දුවට පහර දීමෙන් පසු බලය (F) හා කාලය (t) අතර ප්‍රස්ථාරය පහත දැක්වේ. බෝලය ප්‍රතිවිරුද්ධ දිශාවට පොලා ගනී නම්, බෝලයට පහරදුන් මොහොතට පසු බෝලයේ ප්‍රවේගය වන්නේ,

1) $20ms^{-1}$
2) $25ms^{-1}$
3) $65ms^{-1}$
4) $70ms^{-1}$
5) $110ms^{-1}$



.22 A/L අපි [papers grp]

47. රූපයේ දක්වා ඇති වස්තුවේ ගුරුත්ව කේන්ද්‍රය පිහිය හැක්කේ,

1) A
2) B
3) C
4) D
5) E



48)

මෙම ඔරලෝසුවට ඇත්තේ පැය සහ මිනිත්තු කටුව පමණකි. මෙහි කුඩාම මිනුම කුමක්ද?

1. තත්පර 1
2. තත්පර 5
3. මිනිත්තු 1
4. මිනිත්තු 5
5. මිනිත්තු 15

49) රළු තලයක පා පැදියක් පැදයන විට පා පැදියේ ටයර මත ඇති වන ඝර්ෂණ බලයන්ගේ දිශාව දක්වන රූප සටහන මින් කුමක් ද?



CamScanner
Scanned with CamScanner

50) ස්කන්ධය m වූ වස්තුවනක් පුමට තලයක් මත වූ x නම් ලක්ෂ්‍යයක් පසු කරන්නේ V වේගයෙනි. වස්තුව x හිට h උසකින් වූ ආනත තලයතක් මත වූ y නම් ලක්ෂ්‍යයකට ඉහල නැගෙයි. ස්කන්ධය $m/2$ වූ වස්තුවක් x නම් ලක්ෂ්‍යය $V/2$ ප්‍රවේගයෙන් පසු කරයි නම් එය ආනත තලය මත ඉහල නැගෙන උස වන්නේ,

1. $h/8$ 2. $h/4$ 3. $h/2$ 4. h 5. 2h



22 A/L අපි [papers grp]

PAST PAPERS WIKI

CS CamScanner

Scanned with CamScanner